# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ/ මෙහෙයුම් කළමනාකරණ තාක්ෂණික සේවා ගණයේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2025.03.28 දිනට වයස අවුරුදු 18 ට වැඩි සහ 30 ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025.03.28 වේ. ඒ අනුව 2007.03.28 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. ඉල්ලුම් පත්‍රයේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

**1 වැනි උපලේඛනය**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

01. අයදුම්පත් කැඳවනු ලබන තනතුර : දුම්රිය එන්ජින් රියදුරු III - ශ්‍රේණිය

02. *තනතුරේ රාජකාරි ස්වභාවය* :
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දුම්රිය ධාවනය කිරීමේ කාර්යයයේ දී දුම්රිය එන්ජින් රියදුරුගේ කාර්යය සඳහා විශේෂිත තාක්ෂණික නිපුණතාවන්, එනම් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා මට්ටම් හය(06) යටතට ගැනෙන්නා වූ අදාළ තාක්ෂණික නිපුණතාවෙන් සමන්විතව දුම්රිය එන්ජිම ක්‍රියා කරවීමේ කාර්යය ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන පොදු මූලික අවශ්‍යතාවන් ඉටුකරන සේවා ගණයකි.

03. වැටුප් පරිමාණය : දුම්රිය එන්ජින් රියදුරු - III පෙළ සඳහා අදාළ වන වැටුප් පරිමාණය :

**රු. 34,130 -5x495 – 5x575 – 10x720 – 10x745- රු.54,130.**

04. (අ) *අධ්‍යාපන සුදුසුකම්* :
i. භාෂාව හෝ සාහිත්‍ය , ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකවර විෂයන් 06 කින් සමත් වී තිබීම;

*සහ*

ii. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා විෂයක් ඇතුළුව සියලු විෂයන්ගෙන් එකවර සමත් වී තිබීම.

(ආ) *වෘත්තීය සුදුසුකම්* :
පහත සඳහන් පාඨමාලාවලින් එකක් හෝ රත්මලාන ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනය හෝ රජයේ කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා පුහුණුකිරීමේ අධිකාරිය යටතේ ඇති කාර්මික විද්‍යාලයක හෝ දෑවුරුදු පූර්ණකාලීන ඩීසල් එන්ජින් පිළිබඳ පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම . මෙම පාඨමාලාව ජාතික වෘත්තීය කුසලතා හය (06) මට්ටම විය යුතුය.

i. මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

(ඇ) *කායික සුදුසුකම්* :
i. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
ii. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික වශයෙන් යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.
iii. උස අවම වශයෙන් අඩි 05 අඟල් 04 ක් විය යුතු අතර ප්‍රාශ්වාසයේ දී පපුව අඟල් 32 ට නොඅඩු විය යුතුය.
iv. 6/6, 6/6 දෘෂ්ටි පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ඈ) *වෙනත් සුදුසුකම්* :
i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතුය.
iii. අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

*සටහන* : මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ඉහත (04) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු පමණක් පුරවන අතර , පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

06. *බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය* :

i. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

ii. *විභාග ක්‍රමය* :
(*අ*) විභාගය සිංහල, දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.
(*ආ*) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ ඉල්ලා ඇති සුදුසුකම් සපුරා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

iii. *විභාගයේ විෂයයන්* :
(*අ*) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය
(ආ) තාක්ෂණ දැනුම

iv. *විෂය නිර්දේශය* :
(*අ*) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය : කාලය පැය 1 යි. ලකුණු 100 යි.
අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව , සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. "මෙය ගණිත ගැටලු , සාමාන්‍ය දැනීම , පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න 50ක් ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය"

(*ආ*) තාක්ෂණ දැනුම - කාලය පැය 03 යි. ලකුණු 100 යි.
ඩීසල් එන්ජින් තාක්ෂණය හා ඒ ආශ්‍රිත දැනුම මෙන් ම යන්ත්‍රෝපකරණ පිළිබඳ දැනුම පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොටගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. "ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය"

v. තේරීම් පරිපාටිය :
එක් එක් විෂයකින් ලකුණු 40% ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් විභාගය සමත් වූ අය සේ සැලකෙන අතර, මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන් ම වැඩි ලකුණු ලබා සමත්වන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමක් සිදු නොකෙරේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු III ශ්‍රේණියට පත්කරනු ලැබේ. පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ ඉහත 06 හි IV යටතේ දක්වා ඇති කරුණුවලට යටත් ව විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙළට අනුවය.

vi. විභාග ප්‍රතිඵල :
*ගැසට්* නිවේදනයේ 06 (V) ඡේදය අනුව ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ද ප්‍රතිඵල දන්වා යවනු ඇත.

07. අයදුම්පත් යොමු කිරීම පිළිබඳ උපදෙස් :

i.

❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 පෙබරවාරි මස 28** වැනි දින පෙ.ව. **9.00** විවෘත වන අතර **2025 මාර්තු මස 28** වැනි දින රාත්‍රී **9.00**ට අවසන්වේ.

❖ දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

❖ මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

ii. විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

- ❖ ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
- ❖ අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
- ❖ ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණම මුදල ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

08. i. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් එවනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

ii. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පතෙහි පිටපත ද ගෙවන ලද විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත ද අතැතිව අයදුම් කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය ද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සමඟ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

iii. විභාග අපේක්ෂකයන් විභාගයට පෙර තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවා ගත යුතුය. විභාගයට පළමුවෙන්ම පෙනී සිටින දිනයේ විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවා ගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

iv. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

a. ජාතික හැඳුනුම්පත
b. වලංගු විදේශ ගමන් බලපත්‍රය
c. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ.

11. i. සේවා කොන්දේසි :

බඳවා ගනු ලබන්නේ III වන ශ්‍රේණිය සඳහාය.

ii. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

අ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ආ. විවෘත ක්‍රමය යටතේ බඳවා ගන්නා සෑම තැනැත්තෙකුම වසර දෙකක (02) ආධුනික කාලයකට (මෙම ආධුනික කාලය උපරිම වශයෙන් වසර 03 ක සංශෝධනයකට යටත් විය හැක) යටත් ය. එම කාලය තුළ දුම්රිය එන්ජින් රියදුරු තනතුරට අදාළව රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම , ප්‍රායෝගික පුහුණුව හා කුසලතාවන් වර්ධනය කර ගැනීමට අවස්ථාව සලසනු ඇත. පුහුණු කාලය තුළ දී එම ආධුනිකයින් අනුයුක්ත කරනු ලබන අංශයේ අධීක්ෂණයට හා පාලනයට යටත් වන්නේය. බඳවා ගැනීමේ පරිපාටියේ 7:2 උපවගන්තියේ දැක්වෙන ක්‍රමය තුළින් සේවයට පිවිසෙන ආධුනික නිලධාරියෙකු ආධුනික පුහුණුව අවසානයේ දී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් නොවුනහොත් එම ආධුනික නිලධාරියාගේ සේවය අවසන් කරනු ඇත.

ඇ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව වසර 05 ක් තුළ ලබා ගත යුතුය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

ඈ. තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

12. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජේ. අයි. ඩී. ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2025 පෙබරවාරි මස 20 වැනි දින.

02-175

**තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2025/2026**

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතුය.) අතර සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් සම්මාන 03 ක් සහිත ව සමත් විය යුතුය.

තව ද ඔහු හෝ ඇය,

(අ) පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසලක යටත් පිරිසෙයින් මාස 06 ක පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

*හෝ*

(ආ) ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

*හෝ*

(ඇ) පාසල් ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම.

*හෝ*

(ඈ) කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරගයකට සහභාගී වී තිබීම

*හෝ*

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම, එසේ *නැතහොත්* ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයක දී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතුය.

2. අයදුම්පත් එවීමේ ක්‍රමය :-

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8" x 13 ½" ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර **2025.03.28** වැනි දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ “2025/2026 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව” සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

2.3 රජයේ සේවය, පළාත් රාජ්‍ය සේවය, සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. තෝරාගැනීම :

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත්‍ර අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. පාඨමාලාව පිළිබඳ විස්තර :

4.1 විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05 කින් සමන්විත වේ. :

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත
ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්ෂණයකින් සමන්විත වේ.

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථාවෝචිත පරිදි තෝරාගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය.

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව - මාස 12 කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් රු. 60,000.00 ක මුදලක්, ලදුපතේ ගිණුම් හිමියාගේ නම ලෙස "ලේකම්, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය" හා තැන්පතුවේ අවශ්‍යතාවය වශයෙන් "NISS DIP 25/26" ලෙස සටහන් කර අංක 7040742 දරන ලංකා බැංකුවේ ටොරිංටන් ශාඛාව වෙත පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ගෙවා එම ලදුපතේ ඡායාරූපයක් Diploma@niss.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු අතර එසේ සිදු නොකරන්නන්ගේ මුදල් පිළිබඳව ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වගකියනු නොලැබේ.

පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්ෂකයන් පමණි. එමෙන් ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ආදායකයා ලෙස "**ලේකම්, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**" යනුවෙන් සටහන් කළ යුතුය.මෙම මුදල කුමන හේතුවක් නිසාවෙන් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා "**ක්‍රීඩා ඩිප්ලෝමා**" සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. අනෙකුත් කොන්දේසි :-

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළයුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.3 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂවරයා, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2025 ජනවාරි මස 31 වැනි දින,
අංක 100/7 නිදහස් මාවත,
කොළඹ 07.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2025/2026*

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය**

පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්

01. i. සම්පූර්ණ නම :.......................................................................... මයා/මිය/මෙනෙවිය.

ii. මුලකුරු සමග නම :..........................................................................

iii. සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි භාෂාවෙන් - කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |

iv. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

02. ලිපිනය i. පෞද්ගලික :..........................................................................................

ii. රාජකාරි :..........................................................................................

iii. WhatsApp අංකය :..........................................................................................

iv. විද්‍යුත් තැපැල් ලිපිනය (email address) :.................................................................

03. දුරකථන අංකය (පෞද්ගලික) :.................. දුරකථන අංකය (රාජකාරි) :..................

i. උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

ii. 2025.03.28 දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

04. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? නැතිද? යනවග :..................

පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :..................

05. i. ස්ත්‍රී/පුරුෂ භාවය :...........................
ii. විවාහක/අවිවාහක බව :.....................

06. ඔබ රැකියාවක් කරයි ද?/නොකරයි ද? යන වග

i. තනතුර :.........................
ii. සේවා කාලය :.........................
iii. සේවා ස්ථානය:.........................

07. i. අධ්‍යාපන සුදුසුකම් : - අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය : - | | | | |

විභාග අංකය :.........................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය : - | | | | |

විභාග අංකය :.........................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

iii. අනෙකුත් අධ්‍යාපන සුදුසුකම් (උසස් විභාග/උපාධි)

වර්ෂය : - | | | | |

විභාග අංකය :.........................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න. සියලුම සහතිකපත්වල ඡායා පිටපත් අමුණා එවන්න.)

1. ජාතික මහා ක්‍රීඩා උළෙලේ දක්ෂතා දිස්ත්‍රික්/පළාත්/ජාතික :
..........................................................................................................................
..........................................................................................................................

2. ජාතික සංගම් මගින් පවත්වනු ලබන ජාතික තරගවල දක්ෂතා :
..........................................................................................................................
..........................................................................................................................

3. ජාත්‍යන්තර තරග සඳහා සහභාගීත්වය :
..........................................................................................................................
..........................................................................................................................

09. i. *ගැසට්* නිවේදනයේ 1.1 ඡේදයේ දක්වා ඇති කුමන ඡේදය යටතේ ඉල්ලුම් කරන්නේ ද යන්න දක්වන්න.

| අ | ආ | ඇ | ඈ | ඉ |
|---|---|---|---|---|
| | | | | |

ii. ඉහත දක්වා ඇති එම ඡේදයේ විස්තර වී ඇති පරිදි ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

..........................................................................................................................
..........................................................................................................................

10. වෙනත් කරුණු :
..........................................................................................................................
..........................................................................................................................

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත් රු. 60,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද ? යන වග :
..........................................................................................................................

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සෙකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

........................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................

**රජයේ, පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි.**

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

මෙම ………………… සේවය කරන ………………… වන ………………………… මහතා/ මහත්මිය/මෙනෙවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

…………………………,
සහතික කරන නිලධාරියාගේ අත්සන,
නිල මුද්‍රාව.
නම :………………………
තනතුර :………………………

දිනය :………………………

02-169

---

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**
(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

සායනික සෞඛ්‍ය මනෝවිද්‍යාව සහ වෘත්තීය මනෝ උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව

(2025 - ප්‍රථම කණ්ඩායම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ සායනික සෞඛ්‍ය මනෝවිද්‍යාව සහ වෘත්තීය මනෝ උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හරහා ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය සහතිකලත් මනෝ උපදේශකවරයෙකු වීමට සහ මනෝ උපදේශකවරුන්ගේ විද්‍යාලයේ සාමාජිකත්වය ලබාගැනීමට හැකිවීම.

**සුදුසුකම්** : ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යවහාරික මනෝවිද්‍යාව සහ භාවිතයන් පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව හදාරා තිබීම;

හෝ

පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයක එක් අවුරුදු මනෝවිද්‍යා/ව්‍යවහාරික මනෝවිද්‍යා/මනෝ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම, 2025.02.01 දිනට වයස 18ට වැඩි වීම, යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම සහ සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම.

**පාඨමාලාවේ ස්වභාවය** : න්‍යායාත්මක දේශන මාර්ගගත ක්‍රමයට පැවැත්වෙන අතර සහ PDF නිබන්ධන ඇතුළුව අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ. සායනික පුහුණු (සායනික මනෝවිද්‍යාඥවරුන් යටතේ) ස්ථානීයව ලබා දේ.

**මාධ්‍ය** : සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය** : මාස දහ අටක අර්ධ කාලීන පාඨමාලාවකි.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :**
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ විද්‍යාර්ථීන් සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු. 36,000.00 (මාසිකව රු. 2000) කි. බාහිර අයදුම්කරුවන් සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු. 54,000 (මාසිකව රු. 3000) කි. පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000.00 ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය.

පාඨමාලාව සඳහා අයදුම් කළයුතු ආකාරය :
අයදුම්කරු විසින්,

1. ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ඩිප්ලෝමාධාරී විද්‍යාර්ථීන් සිය ශිෂ්‍ය හැඳුනුම්පතේ ඡායාරූපය ද බාහිර අයදුම්කරුවන් සිය මනෝවිද්‍යා/ව්‍යවහාරික මනෝවිද්‍යා/මනෝ උපදේශන ඩිප්ලෝමාවේ සහතිකපත්‍රයේ ඡායාරූපය සහ
2. සියලුම අයදුම්කරුවන් තම ජාතික හැඳුනුම්පතේ ඉදිරි සහ පසුපිට ඡායාරූපය

070-4191660 (WhatsApp) අංකයට යොමු කළ යුතුය.

පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය :2025/03/23 වේ.

වැඩි විස්තර සඳහා : කාර්යාල වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා
032-3137500 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

02-200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.